12774

ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை National Evaluation and Testing Service ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations
National Evaluation and Testing Service

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන
විවෘත තරග විභාගය - 2011 (2012)

පැය දෙකයි

# (04) කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව

## විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**



✳ ***පැන්සලෙන් ලකුණු කරන ලද හා මකන දියර භාවිත කරන ලද උත්තර ඇගයීමට ලක් නොකෙරේ.***

✳ ***I කොටසට පිළිතුරු සැපයීමේ දී පහත දක්වා ඇති ආකාරයට වඩා වෙනස් ආකාරයට ලියන ලද ඉලක්කම් සහිත උත්තර ඇගයීමට ලක් නොකෙරේ.***

**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන සහ පස්වන පිටුවල ද ඇති තිත් ඉරි මත ලියන්න.**

..................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

..................................

**අයදුම්කරුවන්ට උපදෙස් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වන අතර පිටු **12** කින් යුක්ත වේ.

✳ ***I*** වන කොටස බහුවරණ ප්‍රශ්න **25** කින් ද ***II*** වන කොටස කෙටි පිළිතුරු සපයන ප්‍රශ්න **25** කින් ද සමන්විත ය.

✳ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය දෙකකි.**

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ ***දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.***

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත්‍රය ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස ***නිල් හෝ කළු*** පැනෙන් පමණක් ලියන්න. ***පැන්සල් පාවිච්චි නොකරන්න.***

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ ***අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.***

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| | පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|---|
| I | 2 | 1 - 3 | |
| | 3 | 4 - 10 | |
| | 4 | 11 - 14 | |
| | 5 | 15 - 20 | |
| | 6 | 21 - 25 | |
| II | 7 | 26 - 30 | |
| | 8 | 31 - 35 | |
| | 9 | 36 - 40 | |
| | 10 | 41 - 45 | |
| | 11 | 46 - 48 | |
| | 12 | 49 - 50 | |
| | **එකතුව** | | |

| | | |
|---|---|---|
| **මුළු එකතුව** | **ඉලක්කමෙන්** | |
| | **අකුරෙන්** | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## I කොටස

- අංක **1** සිට අංක **25** තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුත්තේ දී ඇති සිද්ධි හා අවස්ථා ඇසුරෙනි. එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ වරණය තෝරා, එහි **අංකය** දී ඇති **තිත් ඉර මත** ලියන්න.

- අංක **1** සිට අංක **10** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> විදුලි සේවා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරනුයේ සාමාන්‍යාධිකාරිවරයා වන අතර පාලන, මුදල්, විගණන, තාක්ෂණ හා සේවා, නඩත්තු යන අංශ භාරව කළමනාකරුවන් ද වේ. මීට අමතරව සෑම අංශයකට ම සහකාර කළමනාකරුවන් අනුයුක්තව සිටින අතර නඩත්තු, තාක්ෂණ හා සේවා අංශ යටතේ අධීක්ෂණ නිලධාරීන් ද වැඩමුලිකයින් ද සේවය කරති. සංස්ථාවේ පරමාර්ථ, අරමුණු, නීති, ප්‍රතිපත්ති, සැලසුම් සකස් කිරීම ආදී කටයුතු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරි ප්‍රධාන ඉහළ කළමනාකාරිත්වය විසින් සිදු කරනු ලබන අතර සැලසුම්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා සේවාලාභීන් වෙත ගෙනයාම සෙසු කාර්ය මණ්ඩලය විසින් සිදු කෙරේ.
>
> පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විධිමත් සංවිධානයක් ලෙස ක්‍රියාත්මක විදුලි සේවා සංස්ථාවේ වර්තමාන සාමාන්‍යාධිකාරිවරයා වනුයේ කැමිලස් ප්‍රනාන්දු මහතා ය. ආයතන ප්‍රධානියා ලෙස දැඩි උද්‍යෝගයකින් කටයුතු කරන ප්‍රනාන්දු මහතා බලවාදී නායකයකු ලෙස ප්‍රකට ය. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පූර්ණ පක්ෂපාතව කටයුතු කරන ප්‍රනාන්දු මහතා කෙරෙහි කළමනාකාරිත්වය ඇතුළු සෙසු සේවක හවතුන් තුළ ඇත්තේ අප්‍රසාදයකි. දැඩි මත තුළ එල්බ ගනිමින්, දැඩි පාලනයක් ගෙනයන්නකු ලෙස ප්‍රචලිත ප්‍රනාන්දු මහතාගේ තීරණ සම්බන්ධයෙන් බලපෑම් කිරීමට කළමනාකාරිත්වයට හෝ සෙසු සේවක හවතුන්ට අවස්ථාවක් නැත. මෙම තත්ත්වය තුළ සංස්ථාවේ විවිධ වූ සේවක ස්තර තුළ අවිධිමත් සංවිධාන ද බිහිව ඇත.

1. විදුලි සේවා සංස්ථාවේ නිලධාරීන්ගේ වගකීම් හා තනතුරු අනුව නිවැරදි අනුපිළිවෙළින් කාණ්ඩ ගත කිරීම තෝරන්න.
   (1) ඉහළ මට්ටමේ කළමනාකරුවන්, අංශ භාර කළමනාකරුවන්, පහළ මට්ටමේ කළමනාකරුවන්
   (2) ඉහළ මට්ටමේ කළමනාකරුවන්, මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්, පහළ මට්ටමේ කළමනාකරුවන්
   (3) ප්‍රධාන විධායක නිලධාරි, ඉහළ මට්ටමේ කළමනාකරුවන්, පහළ මට්ටමේ කළමනාකරුවන්
   (4) ප්‍රධාන විධායක නිලධාරි, මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්, පහළ මට්ටමේ කළමනාකරුවන් (.........)

2. කැමිලස් ප්‍රනාන්දු මහතා අයත් වනුයේ
   (1) ප්‍රධාන විධායක නිලධාරි කාණ්ඩයට ය.
   (2) ප්‍රධාන මෙහෙයුම් නිලධාරි කාණ්ඩයට ය.
   (3) ඉහළ මට්ටමේ කළමනාකාරිත්වයට ය.
   (4) මධ්‍යම මට්ටමේ කළමනාකාරිත්වයට ය. (.........)

3. විදුලි සේවා සංස්ථාවේ පහළ මට්ටමේ කළමනාකාරිත්වයට අයත් වන්නේ කවුරුන් ද?
   (1) ගණකාධිකාරීන්
   (2) සහකාර කළමනාකරුවන්
   (3) අංශ භාර කළමනාකරුවන්
   (4) වැඩමුලිකයින් (.........)

EXAMMOOD.LK
EXAMMOOD.LK

විභාග අංකය :.........................

4. විදුලි සේවා සංස්ථාව මගින් නව ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරයි. ඒ අනුව එම විදුලි යෝජනා ක්‍රමය නිසි කාල රාමුවක් තුළ ඉදිකිරීමේ වගකීම පැවරෙනුයේ
   (1) ඉහළ මට්ටමේ කළමනාකාරිත්වයට ය.
   (2) මධ්‍යම මට්ටමේ කළමනාකාරිත්වයට ය.
   (3) සාමාන්‍යාධිකාරිට ය.
   (4) අධ්‍යක්ෂ මණ්ඩලයට ය. (.........)

5. විදුලි සේවා සංස්ථාවේ සහාය සේවා පද්ධතිය සමඟ සෘජු ලෙස සම්බන්ධ වන නිලධාරි කාණ්ඩය වනුයේ
   (1) ඉහළ මට්ටමේ කළමනාකරුවන් ය.
   (2) පහළ මට්ටමේ කළමනාකරුවන් ය.
   (3) මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් ය.
   (4) අධ්‍යක්ෂක මණ්ඩලය ය. (.........)

6. කැමිලස් ප්‍රනාන්දු මහතාගේ නායකත්ව ශෛලියේ ලක්ෂණයක් **නොවන්නේ**
   (1) තීරණ ගැනීමේ තනි අයිතිය ඔහු සතුවීම ය.
   (2) කැමිලස් ප්‍රනාන්දු මහතාගේ ප්‍රතිරූපය පිළිබිඹු කෙරෙන පරිසරයක් සංස්ථාව තුළ තිබීම ය.
   (3) සංස්ථාව තුළ පහළ සේවක භවතුන්ගේ නිර්මාණශීලී දායකත්වයකට ඉඩ තිබීම ය.
   (4) සංස්ථාව තුළ දැඩි විනයක් හා පාලනයක් ගෙනයාම ය. (.........)

7. කැමිලස් ප්‍රනාන්දු මහතාගේ නායකත්ව ශෛලියට ප්‍රතිවිරුද්ධ නායකත්ව ශෛලියක් විය හැක්කේ
   (1) අධිකාරී නායකත්ව ශෛලියයි.
   (2) පූර්ණ පාලන නායකත්ව ශෛලියයි.
   (3) සහභාගිත්ව (ප්‍රජාතාන්ත්‍රික) නායකත්ව ශෛලියයි.
   (4) නිදහස් බලවාදී නායකත්ව ශෛලියයි. (.........)

8. කැමිලස් ප්‍රනාන්දු මහතාගේ නායකත්ව ශෛලිය තුළින් විදුලි සේවා සංස්ථාවට ලබා ගත හැකි යහපත් ප්‍රතිඵලයකි,
   (1) සංස්ථාවේ අර්බුදකාරී අවස්ථාවල දී පහසුවෙන් තීරණවලට එළැඹීමට හැකිවීම.
   (2) සංස්ථාව තුළ කැපීපෙනෙන ක්‍රියාකාරීන් බිහි නොවීම.
   (3) යටත් සේවක පිරිසේ දායකත්වය සංස්ථාවට ලබාගත හැකිවීම.
   (4) සේවකයන් තුළ නායකත්වය කෙරෙහි විශ්වාසයක් ඇතිවීම. (.........)

9. පහත සඳහන් ගුණාංග අතුරින් යහපත් ආයතන ප්‍රධානියකු තුළ තිබිය යුතු ගුණාංගයක් තෝරන්න.
   (1) ප්‍රධානියා නිතරම අපි ගැන කතා කරයි
   (2) ප්‍රධානියා සොයන්නේ වැරැද්ද ඇති තැනයි
   (3) ප්‍රධානියා සියලු දෙනා අතර බලය පතුරුවන්නෙකි
   (4) ප්‍රධානියා සිය පිරිස දිරිගන්වන්නෙකි (.........)

10. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අවිධිමත් සංවිධාන පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) විධිමත් සංවිධාන තුළ අවිධිමත් සංවිධාන බිහිවිය හැකි ය.
   (2) අවිධිමත් සංවිධාන තුළ නෛතික තත්ත්වයක් ඇත.
   (3) විධිමත් සංවිධාන තුළ අවිධිමත් සංවිධාන අනිවාර්යයෙන් ම දක්නට ලැබෙන ලක්ෂණයකි.
   (4) අවිධිමත් සංවිධානයක සාමාජිකයකුට වෙනත් අවිධිමත් සංවිධානයක සාමාජිකත්වය ලබාගත නොහැකි ය. (.........)

● අංක **11** සිට අංක **20** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> රජරට ගොවි අධිකාරිය රජය සතු ව්‍යවස්ථාපිත ආයතනයකි. මීට වසර 10 කට පමණ පෙර පාඩු ලබන රාජ්‍ය ආයතනයක් ලෙස පැවති මෙම අධිකාරිය පසුගිය වසරේ දී රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතන පිළිබඳ සොයා බලන පාර්ලිමේන්තු කාරක සභා වාර්තාවේ ලාබ ලබන රාජ්‍ය ආයතන ලැයිස්තුවට ඇතුළත් කර ඇත.
>
> මෙම අධිකාරියේ වර්තමාන කළමනාකාරිත්වයේ සුබවාදී හා දූරදර්ශී තීරණ හා නායකත්වය නිසා පසුගිය වසර දෙක තුළ දී අධිකාරිය සීඝ්‍ර දියුණුවක් ලබා ඇත. පසුගිය වසර දෙක තුළ දී අධිකාරියේ කාර්යක්ෂමතාව, සඵලදායිතාව (Effectiveness) හා ඵලදායිතාව (Productivity) ඉහළ මට්ටමකට පැමිණ ඇති අතර ඊට සේවක හවතුන්ගේ සුබවාදී ආකල්ප වර්ධනය මෙන්ම සේවක අභිප්‍රේරණය ද වැදගත් වී ඇත. මේ සඳහා කළමනාකාරිත්වය විසින් සේවක හවතුන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය, සුබසාධනය හා ආකල්ප සංවර්ධනය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර අධිකාරියේ භෞතික පරිසරය සංවර්ධනය සඳහා විවිධ ඵලදායිතා සංකල්ප පදනම් කරගත් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව අධිකාරියේ සේවා නිසි ප්‍රමිතියක් යටතේ ක්‍රියාත්මක කිරීම මත ජාත්‍යන්තර තත්ත්ව සහතිකයක් ද ලැබී ඇත. එසේ ම මෙම වසරේ දී අධිකාරිය ඵලදායිතා තරගවලට ඉදිරිපත් කිරීමට ද කළමනාකාරිත්වය තීරණය කර ඇත.

11. රජරට ගොවි අධිකාරියේ කාර්යක්ෂමතාව වැඩිවීමට හේතුවක් විය හැක්කේ
    (1) අධිකාරියට උචිත අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කර තිබීම ය.
    (2) අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමේ දී සම්පත් නිසි ආකාරයෙන් යොදා ගැනීම ය.
    (3) දිගුකාලීන අරමුණු හා පරමාර්ථ නිශ්චය කරගෙන තිබීම ය.
    (4) අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට උපාය මාර්ගික සැලසුම් අනුගමනය කිරීම ය. (.........)

12. ආයතනයක ප්‍රගතිය පෙන්නුම් කෙරෙන කෙටිකාලීන මිනුම් දණ්ඩකි,
    (1) ඵලදායිතාව.
    (2) සඵලදායිතාව.
    (3) කාර්යක්ෂමතාව.
    (4) කාර්යසාධනය. (.........)

13. රජරට ගොවි අධිකාරියේ ඵලදායිතාව මැනිය හැකි සරල සමීකරණය කුමක් ද?

    (1) $\text{ඵලදායිතාව} = \dfrac{\text{සඵලදායිතාව}}{\text{යෙදවුම්}}$

    (2) $\text{ඵලදායිතාව} = \dfrac{\text{කාර්යක්ෂමතාව}}{\text{යෙදවුම්}}$

    (3) $\text{ඵලදායිතාව} = \dfrac{\text{යෙදවුම්}}{\text{නිමැවුම්}}$

    (4) $\text{ඵලදායිතාව} = \dfrac{\text{නිමැවුම්}}{\text{යෙදවුම්}}$ (.........)

14. රජරට ගොවි අධිකාරියේ සඵලදායිතාව මගින් පිළිබිඹු කෙරෙනුයේ
    (1) එම අධිකාරිය කොතෙක් දුරට අපේක්ෂිත අරමුණු ළඟා කරගත්තේ ද යන්න ය.
    (2) යෙදවුම් හා නිමැවුම් අතර තිබෙන ප්‍රමාණාත්මක සබඳතාවය ය.
    (3) කළ යුතු දේ නිවැරදිව සිදුකර ඇත් ද යන්නය ය.
    (4) සම්පත් නිසි ආකාරයෙන් කළමනාකරණය කරගෙන ඇත් ද යන්න ය. (.........)

EXAMMOOD.LK

15. රජරට ගොවි අධිකාරියේ කාර්යාලයීය භෞතික පරිසරය සංවර්ධනය සඳහා යොදාගත හැකි ඵලදායිතා සංකල්පය තෝරන්න.

(1) 5 m'S සංකල්පය

(2) 5 S සංකල්පය

(3) 7 m'S සංකල්පය

(4) 8 S සංකල්පය (.........)

16. රජරට ගොවි අධිකාරියේ කාර්යාලයේ සේවා කටයුතු නිසි ක්‍රමවේදයක් ඔස්සේ නිසි තත්ත්වයකට සිදු කිරීම තුළින් එම අධිකාරියට ලබාගත හැකි ජාත්‍යන්තර තත්ත්ව සහතිකයකි,

(1) ISO 9000 : 2008 තත්ත්ව සහතිකය.

(2) ISO 9001 : 2008 තත්ත්ව සහතිකය.

(3) ISO 9002 : 2008 තත්ත්ව සහතිකය.

(4) ISO 9003 : 2008 තත්ත්ව සහතිකය. (.........)

17. රජරට ගොවි අධිකාරියේ ඵලදායිතා සංකල්ප ක්‍රියාත්මක කිරීම හා ඵලදායිතාව වර්ධනය වීම හේතුවෙන් එම අධිකාරියට ඉදිරිපත් විය හැකි ජාතික මට්ටමේ තරගාවලියකි,

(1) ජාතික තත්ත්ව පාලන සම්මාන තරගාවලිය.

(2) ජාතික සඵලදායිතා සම්මාන තරගාවලිය.

(3) ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය.

(4) රාජ්‍ය සේවා ඵලදායිතා සම්මාන තරගාවලිය. (.........)

18. රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතනවල කටයුතු විමර්ශනය කෙරෙන පාර්ලිමේන්තු කාරක සභාව වනුයේ

(1) රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු සභාවයි.

(2) රාජ්‍ය ව්‍යාපාර හා සංස්ථා පිළිබඳ උපදේශක කාරක සභාවයි.

(3) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවයි.

(4) පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රී කාරක සභාවයි. (.........)

19. රජරට ගොවි අධිකාරියේ සේවකයන් තුළ ආකල්ප සංවර්ධනයට බලපෑමක් **නොවූ** සාධකයක් විය හැක්කේ

(1) වැටුප් හා දීමනා ය.

(2) අධීක්ෂණය ය.

(3) උසස්වීම් සඳහා විවෘත අවකාශය ය.

(4) වෘත්තීය සමිති බලපෑම් ය. (.........)

20. රජරට ගොවි අධිකාරියේ සේවකයින් අභිප්‍රේරණය කිරීම යනු

(1) අධිකාරියේ කාර්යක්ෂමතාව සඳහා සේවක භවතුන්ගේ දායකත්වය අනිවාර්යයෙන් ම ලබා ගැනීමයි.

(2) අධිකාරියේ සේවා කටයුතු සඳහා සේවක භවතුන්ගේ උපරිම දායකත්වයක් ඔවුන්ගේ කැමැත්තෙන් ලබා ගැනීමට ඔවුන් පෙළඹවීමයි.

(3) අධිකාරියේ සඵලදායිතාව වර්ධනය සඳහා සේවක භවතුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීමයි.

(4) අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සේවක භවතුන්ගේ නිර්මාණශීලී දායකත්වය ලබා ගැනීමයි. (.........)

- අංක **21** සිට අංක **25** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> ග්‍රාමීය අතුරු මාර්ග සංවර්ධනය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන මණ්ඩලය රජය මගින් මෑතක දී පිහිටුවන ලදී.
>
> මෙම මණ්ඩලය පිහිටුවීමෙන් අනතුරුව එහි අධ්‍යක්ෂ මණ්ඩලය හා ඉහළ කළමනාකාරිත්වය රැස්වී මණ්ඩලයේ අරමුණු, පරමාර්ථ නිශ්චය කර ගනිමින් සැලසුම් සකස් කරන ලදී. එසේ නිශ්චය කර ගන්නා ලද සැලසුම් නිශ්චිත ඉලක්ක හා කාල වකවානු ඔස්සේ ක්‍රියාත්මක කිරීමට සංවිධාන කටයුතු සිදු කිරීමටත්, ග්‍රාමීය මාර්ග සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා සඳහා මාණ්ඩලීකරණය සිදු කරමින්, සියලු කටයුතු අධීක්ෂණය කරමින් මණ්ඩලයේ කාර්යභාරය අධ්‍යක්ෂණයටත් පියවර ගන්නා ලදී.
>
> එසේම මණ්ඩලයේ බාහිර පරිසර සාධක පිළිබඳව දැඩි අවධානයක් යොමු කරමින් මණ්ඩලයේ අභ්‍යන්තර පරිසරය නිසි ලෙස ස්ථාපිත කිරීමට ද කටයුතු යොදන ලදී.

21. ග්‍රාමීය මාර්ග සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වයේ කාර්යයන් අනුපිළිවෙළින්
    (1) සැලසුම්කරණය, සංවිධානකරණය, අධ්‍යක්ෂණය හා මාණ්ඩලීකරණය වේ.
    (2) සැලසුම්කරණය, අධ්‍යක්ෂණය, මාණ්ඩලීකරණය හා සංවිධානකරණය වේ.
    (3) සංවිධානකරණය, අධ්‍යක්ෂණය, මාණ්ඩලීකරණය හා සැලසුම්කරණය වේ.
    (4) සැලසුම්කරණය, සංවිධානකරණය, මාණ්ඩලීකරණය හා අධ්‍යක්ෂණය වේ. (.........)

22. ග්‍රාමීය මාර්ග සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් මාණ්ඩලීකරණය මගින් සිදු කරන ලද්දේ මණ්ඩලයේ
    (1) අරමුණු නිශ්චය කිරීමයි.
    (2) පරමාර්ථ නිශ්චය කිරීමයි.
    (3) මිනිස්බල අවශ්‍යතා සැලසුම් කිරීමයි.
    (4) කාර්යයන් පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමයි. (.........)

23. ග්‍රාමීය මාර්ග සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් සේවක භවතුන් මෙහෙයවීම, දිරිගැන්වීම හා මගපෙන්වීම යන ක්‍රියාවලිය හැඳින්විය හැක්කේ
    (1) අධ්‍යක්ෂණය නමිනි.
    (2) මාණ්ඩලීකරණය නමිනි.
    (3) සැලසුම්කරණය නමිනි.
    (4) අභිප්‍රේරණය නමිනි. (.........)

24. ග්‍රාමීය මාර්ග සංවර්ධන මණ්ඩලයේ අභ්‍යන්තර පරිසර සාධකයකි,
    (1) පාරිභෝගිකයින්.
    (2) සේවාලාභීන්.
    (3) මණ්ඩලයේ අරමුණු හා පරමාර්ථ.
    (4) ආයෝජකයින්. (.........)

25. ග්‍රාමීය මාර්ග සංවර්ධන මණ්ඩලයේ බාහිර පරිසර සාධකයකි,
    (1) සම්පත්.
    (2) කළමනාකරුවන්.
    (3) අරමුණු.
    (4) තරගකරුවන්. (.........)

## II කොටස

- අංක **26** සිට අංක **50** තෙක් ප්‍රශ්නවලට දී ඇති සිද්ධි/අවස්ථා මත පදනම්ව කෙටි පිළිතුරු සපයන්න.
- අංක **26** සිට අංක **30** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> 2012.04.12 වන දින ප.ව. 2.18 ට ඉන්දුනීසියාවේ සුමාත්‍රා දූපත් ආශ්‍රිතව සිදුවූ ප්‍රබල භූමිකම්පාවක් හේතුවෙන් ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ සුනාමි තත්ත්වයක් උද්ගත විය හැකි බවට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් අනතුරු ඇඟවීම් නිකුත් විය. විශේෂයෙන් දකුණු වෙරළබඩ තීරයට මෙදින ප.ව. 4.50 ට පමණ වන විට සුනාමි තත්ත්වයක් ඇති විය හැකි බව අවධාරණය කෙරිණි.
>
> දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වන බැරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 10 ක් පමණ වෙරළබඩ ප්‍රදේශයට අයත් වේ. මෙම වෙරළබඩ තීරයේ පවුල් 500 ක් පමණ ජීවත් වේ.
>
> සුනිමල් පෙරේරා මහතා බැරගම ප්‍රාදේශීය ලේකම්වරයා ය. සිංහල හා හින්දු අලුත් අවුරුදු නිවාඩුව හේතුවෙන් මෙදින සුනිමල් මහතා සිය කොට්ඨාසයෙන් බැහැරව කිලෝමීටර 50 ක් පමණ දුරකින් පිහිටි සිය නිවසේ රැඳී සිටියේය. ප.ව. 2.50 ට පමණ සිය ජංගම දුරකථනයට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් සුනාමි තත්ත්වය පිළිබඳව ප්‍රථම අනතුරු ඇඟවීම සිදු කරන ලදී.

26. සුනිමල් පෙරේරා මහතා හමුවේ තිබූ ප්‍රධාන අභියෝගය කුමක් ද?

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

27. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් ලද අනතුරු ඇඟවීම මත සුනිමල් පෙරේරා මහතා විසින් වහාම ගත යුතුව තිබූ ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

.........................................................................................................................................

.........................................................................................................................................

28. සුනාමි තත්ත්වයකට මුහුණ දීම සඳහා සුනිමල් පෙරේරා මහතා විසින් ගත යුතුව තිබූ පූර්ව ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

29. වෙරළ තීරයෙන් ජනතාව ඉවත් කිරීම සඳහා ගත හැකිව තිබූ ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

30. සුනාමි තත්ත්වයකට මුහුණ දීම සඳහා සහාය ලබා ගත යුතුව තිබූ, තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි රාජ්‍ය ආයතන **දෙකක්** සඳහන් කරන්න.

.........................................................................................................................................

.........................................................................................................................................



EXAMMOOD.LK
EXAMMOOD.LK

- අංක **31** සිට අංක **35** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> රජයේ නිල තොරතුරු ජනතාව වෙත දැනුම් දීම සඳහා රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය රජය මගින් ස්ථාපිත කර, වෝල්ටර් සුබසිංහ මහතා එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරන ලදී. මීට අමතරව දිස්ත්‍රික් මට්ටමින් සහකාර අධ්‍යක්ෂවරුන් ද පත් කරන ලදී.
>
> එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ සැසිවාරයේ දී ශ්‍රී ලංකාවට එරෙහි ව යෝජනාවක් සම්මත කිරීමේ සූදානම පිළිබඳව තොරතුරු මෙම මධ්‍යස්ථානයට වාර්තා විය. එසේම එම යෝජනාවේ අන්තර්ගත තොරතුරුවල ඇති සාවද්‍ය බව හා එමගින් ශ්‍රී ලංකාවට ඇති වන බලපෑම පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජනතාව, මහජන නියෝජිතයින්, ආගමික නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙස වොල්ටර් සුබසිංහ මහතාට රජයෙන් උපදෙස් ලැබුණි.

31. ප්‍රාදේශීය වැඩ සටහන් සංවිධානය කිරීම සඳහා සුබසිංහ මහතාට සම්බන්ධ කර ගත හැකි ප්‍රාදේශීය ආයතනික ව්‍යුහ **දෙකක්** සඳහන් කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

32. දැනුවත් කිරීමේ වැඩ සටහන් සම්පාදනය කිරීමට සම්බන්ධ කර ගත යුතු සම්පත් දායකයින් **දෙදෙනකු** නම් කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

33. දැනුවත් කිරීමේ වැඩ සටහන සඳහා ප්‍රාදේශීය මහජන නියෝජිතයින් සම්බන්ධ කර ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

34. දේශනවලට අමතරව, ජනතාව දැනුවත් කිරීම සඳහා යොදා ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

35. ප්‍රාදේශීය ආගමික නායකයින් දැනුවත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රශස්ත වැඩසටහනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

[ 9 වැනි පිටුව බලන්න

● අංක **36** සිට අංක **40** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> උතුරු පළාතේ ක්‍රීඩා කටයුතුවල පුනර්ජීවයක් ඇතිකිරීම සඳහා උතුරු පළාත් ක්‍රීඩා අධිකාරිය පිහිටුවන ලදී. ත්‍රස්තවාදී අරගලය හේතුවෙන් වසර ගණනාවක් ඇණහිට තිබූ උතුරු පළාතේ ක්‍රීඩා කටයුතු නගා සිටුවමින් එම පළාතේ පදිංචි පාසල් හා යොවුන් ක්‍රීඩකයින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමට කටයුතු සංවිධානය කිරීම මෙම අධිකාරියේ ප්‍රධාන වගකීමකි.
>
> එස්. ස්කන්ධරාජා මහතා මෙම අධිකාරියේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ඔහු යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රීඩා) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (තාක්ෂණ) වශයෙන් නිලධාරීන් දෙදෙනකු ද පත් කරන ලදී. මීට අමතරව සෘජුව ම අධ්‍යක්ෂවරයාට වගකියන නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමේ ම ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු ද පත්කරන ලදී. එසේ ම සහකාර අධ්‍යක්ෂවරයකු (ක්‍රීඩා) ද පත් කරන ලදී. මීට අමතරව අධිකාරියේ පාලන කටයුතු සඳහා අධ්‍යක්ෂකවරයාට සෘජුව ම වගකියන සහකාර අධ්‍යක්ෂ මට්ටමට පහළින් සිටින පරිපාලන නිලධාරියකු ද පත් කරන ලදී.

36. උතුරු පළාත් ක්‍රීඩා අධිකාරිය සඳහා "දැක්ම (visson)" ප්‍රකාශයක් සකස් කරන්න.

.............................................................................................................................................

37. උතුරු පළාත් ක්‍රීඩා අධිකාරියේ පරමාර්ථ **දෙකක්** සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

38. උතුරු පළාත් ක්‍රීඩා අධිකාරිය හමුවේ ඇති ප්‍රධාන අභියෝගය කෙටියෙන් පැහැදිලි කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

39. උතුරු පළාත තුළ සිටින, ක්‍රීඩා දක්ෂතා ඇති අය හඳුනා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහනක් කෙටියෙන් සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

40. ඉහත ඡේදයට අදාළව උතුරු පළාත් ක්‍රීඩා අධිකාරියේ සංවිධාන සටහන දක්වන්න.



EXAMMOOD.LK
EXAMMOOD.LK

- අංක **41** සිට අංක **45** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> රස්නායකපුර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යක්‍ෂවරයා ලෙස සිරිමෙවන් සුරවීර මහතා වැඩ බාරගෙන මේ වනවිට වසරක පමණ කාලයක් ගතවී ඇත.
>
> මීට වසර දෙකකට පමණ පෙර රස්නායකපුර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය ඉතාමත් අකාර්යක්‍ෂම, අවිධිමත් කාර්යාලයක් ලෙස ප්‍රසිද්ධව පැවතුණි. විශේෂයෙන් රාජකාරි කටයුතු සඳහා කාර්යාලයට පැමිණෙන ගුරුවරුන් මෙන්ම සාමාන්‍ය ජනතාව ද විවිධ අසීරුතාවන්ට පත් වූහ.
>
> එහෙත් සිරිමෙවන් සුරවීර මහතා වැඩ බාර ගැනීමෙන් අනතුරුව ඔහු විසින් කාර්යාලයේ සියලු ම අංශ ප්‍රතිසංවිධානය කර කාර්යක්‍ෂම සේවයක් සිය කාර්යාලයෙන් ලබා දිය හැකි පරිසරයක් ගොඩනගන ලදී.
>
> මෙහි දී තම කාර්ය මණ්ඩලයේ ආකල්ප වෙනස් කිරීමත්, කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමත් සඳහා තත්ත්ව කව පිහිටුවීම වැනි ක්‍රියාකාරකම් හඳුන්වා දෙන ලදී. මීට අමතරව කාර්යාලයේ භෞතික පරිසරය පිරිසිදුව, ක්‍රමානුකූලව හා සේවාලාභීන්ගේ පහසුව මූලික කර ගනිමින් සකස් කිරීම සඳහා පංචවිධ සංකල්පය ඇතුළු විවිධ ඵලදායිතා වැඩසටහන් හඳුන්වා දෙන ලදී. එසේ ම කාර්ය මණ්ඩලයේ සෑම සේවකයෙකුගේ ම ගැටලුවලට සවන් දී, ඔවුන්ගේ වැඩ පිළිබඳ අධ්‍යයනයක් සිදු කර, සාධාරණ වැඩ බෙදීමක් ද සිදු කරන ලදී.

41. සිරිමෙවන් සුරවීර මහතා අධ්‍යක්‍ෂවරයා වශයෙන් වැඩ බාර ගැනීමේ දී ඔහු හමුවේ තිබූ ප්‍රධානතම අභියෝගයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

42. සිරිමෙවන් සුරවීර මහතා වැඩ බාර ගැනීමට පෙර රස්නායකපුර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ අකාර්යක්‍ෂමතාවට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

43. සිරිමෙවන් සුරවීර මහතා තම කාර්යාලයේ කාර්යක්‍ෂමතාව වැඩි කිරීම සඳහා භාවිත කළ විධි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

44. සිරිමෙවන් සුරවීර මහතා සතු යහපත් කළමනාකරණ ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

45. රස්නායකපුර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයට පැමිණෙන සේවාලාභීන් වෙනුවෙන් සිරිමෙවන් සුරවීර මහතා කාර්යාලයේ සිදු කළ වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

- අංක **46** සිට අංක **50** තෙක් ප්‍රශ්න පහත සඳහන් සිද්ධිය/අවස්ථාව මත පදනම් වේ.

> හරිතපුර මහනගර සභාව පිළිබඳව එම නාගරික බලප්‍රදේශයේ වෙසෙන ජනතාව තුළ ඇත්තේ දැඩි අප්‍රසාදයකි.
>
> කැලිකසළ ඉවත් කිරීමට හා කළමනාකරණයට නිසි වැඩ පිළිවෙළක් නොමැතිවීම, සභාවට අයත් මාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම, වීථි පහන් නිසි පරිදි නඩත්තු නොකිරීම ආදී චෝදනා නාගරික ජනතාව වෙතින් නිරන්තරයෙන් එල්ල වේ.
>
> එසේම නගරයේ හෝටල් හා වෙළෙඳසැල්වල පවතින අපිරිසිදු බව, සභාවට විවිධ කටයුතු සඳහා පැමිණෙන ජනතාවගෙන් නගර සභා සේවකයින් අල්ලස් ලබා ගැනීම ආදී චෝදනා ද ජනතාවගෙන් නගර සභාව වෙත එල්ල වේ.

මෙම මහනගර සභාවේ නව නාගරික කොමසාරිස්වරයා ලෙස ඔබ පත්වූවා යැයි උපකල්පනය කර පහත සඳහන් ප්‍රශ්නවලට ප්‍රායෝගික හා ප්‍රශස්ත පිළිතුරු සපයන්න.

46. ඔබ හමුවේ ඇති ප්‍රධාන අභියෝග **දෙකක්** සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

47. කැලිකසළ කළමනාකරණය සඳහා ඔබගේ නගරාධිපතිවරයාට ඉදිරිපත් කිරීම සඳහා වූ ප්‍රශස්ත යෝජනාවක් කෙටියෙන් සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

48. ඔබ නාගරික බලප්‍රදේශයේ හෝටල්වල සහ වෙළෙඳසැල්වල පිරිසිදු බව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි වැඩසටහනක් කෙටියෙන් සඳහන් කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

49. නගර සභා සේවකයින් ජනතාවගෙන් අල්ලස් ලබා ගැනීම වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් සඳහන් කරන්න.

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

50. නගර සභාවේ කටයුතුවලට නාගරික ජනතාවගේ සහාය ලබා ගැනීම සඳහා සුදුසු වැඩ සටහනක් යෝජනා කරන්න.

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

***

EXAMMOOD.LK
EXAMMOOD.LK